රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

# 2023-09-04 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. ජල කළමනාකරණ අවශ්‍යතාව හදිසි තත්ත්වයක් ලෙස සලකා ඒකාබද්ධ ප්‍රවේශයක් යටතේ කටයුතු කිරීම

පසුගිය දිනවල පැවති වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් දිවයිනේ දිස්ත්‍රික්ක 17කට අයත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 70ක පදිංචි පවුල් 84,000කට පමණ පානීය ජල හිඟයකට මුහුණපෑමට සිදුව ඇති බව ජාතික ආපදා සහන මධ්‍යස්ථානය විසින් 2023-08-22 දින ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති වාර්තාවක් මඟින් පෙන්වා දී ඇත. එම තත්ත්වය යටතේ රට තුළ පිහිටි ජලාශ පද්ධතිවල ප්‍රමාණවත් ජල ධාරිතාවක් එක් රැස්වන තෙක් දැනට පවතින සීමිත ජල ධාරිතාවන් ප්‍රශස්ත අයුරින් පරිහරණය කිරීම සහ කළමනාකරණය කිරීම කළ යුතුව තිබේ. අමාත්‍ය මණ්ඩලය විසින් 2023-07-10 දින අනුමත කරන ලද ජාතික ජල සම්පත් ප්‍රතිපත්තියට අනුව පානීය ජලය සැපයීමට ප්‍රමුඛතාවක් ලබා දිය යුතු අතර, අනෙකුත් ජල පාර්ශ්වකරුවන් ආරක්ෂා කිරීමට ද රජය බැඳී සිටී. ඒ අනුව, ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබෙන තෙක් පානීය ජලය සම්පාදනය හදිසි හා ප්‍රමුඛතම අවශ්‍යතාවයක් ලෙස සලකා කටයුතු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස ජාතික ජලසම්පත් ප්‍රතිපත්තිය මඟින් යෝජිත ජාතික ජල සම්පත් සභාව හදිසි ක්‍රියාකාරී කමිටුවක් වශයෙන් කටයුතු කිරීමටත් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා; වාරිමාර්ග අමාත්‍යතුමා; සහ ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් යෝජනා සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

## 02. මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි 2023 දෙවන කාර්තුව අවසන් වන විට ප්‍රගතිය

රේඛීය අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් 202ක 2023 දෙවන කාර්තුව අවසන් වන විට අත්කර ගනු ලැබ ඇති ප්‍රගතිය පිළිබඳව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලදී. දැනට ආරම්භ කර ඇති ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් වන තෙක් විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්ට අදාළ අරමුදල් උපයෝජනය කළ නොහැකි වීම සහ දේශීය අරමුදල් නිදහස් කිරීම සීමිත වීම හේතු කොට ගෙන 2023 දෙවන කාර්තුව අවසන් වන විට

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු ‍தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

ව්‍යාපෘති බොහොමයක ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පවතින බව අමාත්‍ය මණ්ඩලය සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් වීමෙන් අනතුරුව විදේශීය අරමුදල් උපයෝජනය කිරීමට හැකියාව ලැබෙන තෙක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති අතුරින් රජයේ 2048 සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට සහ දැනට පවතින ආර්ථික අර්බුදයට පිළියමක් ලෙස ආයකත්වය ලබා දිය හැකි ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් 2024 වර්ෂයේදී අයවැය ප්‍රතිපාදන වෙන් කර දීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**03. වෘත්තීය මාර්ගෝපදේශනය තුළින් තෘතියික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය අවසන් කරනු ලබන ශිෂ්‍යයන් අ.පො.ස. (උසස් පෙළ) අධ්‍යයන කටයුතු ආරම්භ වන තෙක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගය අවසන් කරන ශිෂ්‍යයන් වෘත්තීය අධ්‍යාපනයට යොමු වන තෙක් පාසල් පද්ධතිය තුළ රඳවා ගනිමින් වෘත්තීය අධ්‍යාපනට අදාළ මූලික ක්ෂේත්‍ර පහක් ආවරණය වන පරිදි විෂය මාලාවක් සම්පූර්ණ කිරීම පිණිස ඔවුන් සඳහා අවස්ථාව සලසා දීමේ වැඩපිළිවෙලක් සැලසුම් කර ඇත. වෘත්තීය අධ්‍යාපනය සඳහා පොදුවේ වැදගත් වන තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන වශයෙන් ද ඊට සමගාමීව මෘදු කුසලතා වර්ධනය කිරීම ද එකී වැඩසටහන මඟින් අපේක්ෂා කරනු ලබයි. ප්‍රථමයෙන්, යෝජිත වැඩසටහන නියමු ව්‍යාපෘතියක් වශයෙන් දිවයිනේ සෑම අධ්‍යාපන කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි තෝරා ගත් පාසල් 320ක මාස 3 - 4ක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක කිරීමටත්, ඉන් අනතුරුව නියමු ව්‍යාපෘතියේ ප්‍රතිඵල මත 2024 වර්ෂයේ සිට එම ව්‍යාපෘතිය ජාතික වැඩසටහනක් වශයෙන් ක්‍රියාත්මක කිරීමටත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු මුතුරාජවෙල පිහිටි ඉඩම් කොටස් කිහිපයක පරවශ්‍යතා අයිතිය ලංකා විදුලිබල මණ්ඩලයේ භූගත නළ පද්ධතියක් එලීම සඳහා බදු දීම**

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු මුතුරාජවෙල පිහිටි අක්කර 69ක් වූ ඉඩම් කොටසක් 1997 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලය වෙත විකිණීමෙන් බැහැර කර ඇති අතර, ඉන් කොටසක යුගදනවි බලාගාරය ඉදි කර තිබේ. එම ඉඩමේ ඉතිරි කොටසේ මේ වන විට සොබදනවි නව විදුලි බලාගාරය ඉදි වෙමින් පවතී. එම ඉන්ධන බලාගාර සඳහා භූගත සිසිලන නළ මාර්ග සහ භූගත ඉන්ධන නළ මාර්ග ඉදි කිරීමේ අවශ්‍යතාවන් හඳුනාගෙන ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා ඉඩම්

සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු මුතුරාජවෙල පිහිටි නවත් ඉඩම් කොටස් කිහිපයක් හඳුනාගෙන ඇති අතර, එකී ඉඩම් කොටස්වල පරවශයතා අයිතිය උප කල්බදු ලබා දීමේ අයිතිය ද සහිතව ලංකා විදුලිබල මණ්ඩලය වෙත බදු පදනම මත ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. කිරුළපන, ඩී.එම්.කොළඹගේ මාවතෙහි පිහිටි ඉඩම් කොටසක් වරකාගොඩ ශ්‍රී ඤාණරතන සමාජ සුභසාධන පදනම වෙත ලබා දීම**

කොළඹ හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල පවත්වන ජාතික හා ආගමික උත්සව ඇතුළු අනෙකුත් අවශ්‍යතාවන් සඳහා දුරබැහැර ප්‍රදේශවල සිට වැඩම කරනු ලබන ස්වාමීන් වහන්සේලාට නවාතැන් පහසුකම් සපයා ගැනීම පිණිස නිල ආරාමයක් ඉදිකිරිමට සුදුසු බිම් කොටසක් ලබා දෙන ලෙස මහනුවර අස්ගිරි මහා විහාරයේ මහානායක ස්වාමීන් වහන්සේ විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒ සඳහා කිරුළපන, ඩී.එම්.කොළඹගේ මාවතෙහි පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය සතු පර්චස් 27ක ඉඩම් කොටසක් හඳුනාගෙන ඇති අතර, එකී ඉඩම් කොටස භික්ෂු ආරාමයක් ඉදි කිරීම සඳහා වරකාගොඩ ශ්‍රී ඤාණරතන සමාජ සුභසාධන පදනම වෙත නිදහස් දීමනා පත්‍රයක් මඟින් පවරා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය විසින් කොමරෝස් සංගමය සහ සාඕ ටෝමේ හා ප්‍රින්සිපේ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීම**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගත් ස්වෛරී රාජ්‍ය 54ක් අප්‍රිකානු කලාපය සතුව පවතී. ඒ අතුරින් රටවල් 46ක් සමඟ ශ්‍රී ලංකාව රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවා ගෙන ඇති අතර, නවත් රටවල් 6කින් එකඟතාව අපේක්ෂාවෙන් සිටී. ඒ අනුව, අප්‍රිකානු කලාපයේ නැගෙනහිර අප්‍රිකාවේ පිහිටි දූපත් සමූහයකින් සමන්විත කොමරෝස් සංගමය සහ ගිනියා බොක්කෙහි පිහිටි අප්‍රිකානු දූපතක් වන සාඕ ටෝමේ හා ප්‍රින්සිපේ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගැනීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම 2023-2027**

ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනය පිළිබඳ පළමු ප්‍රතිපත්තිය ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිය වශයෙන් 2008 වර්ෂයේදී සකස් කරනු ලැබ ඇත. එම ප්‍රතිපත්තිය, අදාළ අමාත්‍යාංශ, විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, විදේශ රැකියා නියෝජිතායතන, පෞද්ගලික අංශය, සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති, විද්වතුන්, පර්යේෂණ ආයතන හා සංවර්ධන හවුල්කරුවන්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන ඇතුළු ශ්‍රම විගමන අංශයේ සියලු පාර්ශ්වයන්ගේ අදහස් ලබා ගෙන නැවත සමාලෝචනය කර රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම 2023-2027 කෙටුම්පත් කරනු ලැබ තිබේ. ඒ අනුව, ජාතික හා ජාත්‍යන්තර නෛතික සහ ප්‍රතිපත්ති රාමුවලට අනුකූලව සකස් කරනු ලැබ ඇති එකී ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම 2023-2027 ක්‍රියාත්මක කිරීම පිණිස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **විද්‍යුත් ත්‍රිරෝද රථ ලියාපදිංචිය සඳහා ප්‍රතිපාදන සැලසීම**

විද්‍යුත් ත්‍රිරෝද රථ නිෂ්පාදනයේදී සහ පෙට්‍රල් හෝ ඩීසල් භාවිතයෙන් ධාවනය කරනු ලබන ත්‍රිරෝද රථ විදුලි බලයෙන් ධාවනය කිරීමට හැකි වනු පිණිස පරිවර්තනය කිරීමේදී ඒ සඳහා විද්‍යුත් ආරෝපිත බැටරි භාවිත කරන බැවින් එවැනි ත්‍රිරෝද රථවල තාර බර කිලෝග්‍රෑම් 500 ඉක්මවන බව හඳුනාගෙන ඇත. එසේම, මෝටර් වාහන පනතේ අර්ථ නිරූපණය අනුව මෝටර් ට්‍රයිසිකලයක තාර බර කිලෝග්‍රෑම් 500ක් හා දළ බර කිලෝග්‍රෑම් 1000ක් නොඉක්මවිය යුතු වේ. ඒ අනුව, විද්‍යුත් ත්‍රිරෝද රථ ලියාපදිංචි කිරීමට පවතින බාධාවන් ඉවත් කරමින් මෝටර් වාහන පනත සංශෝධනය කිරීම පිණිස 2022-08-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එකී අනුමැතිය පරිදි නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **1972 අංක 7 දරන ගෙවල් කුලී පනත අවලංගු කිරීම සහ පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත හඳුන්වා දීම**

ඉඩම් හිමියන්ගේ සහ කුලී නිවැසියන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් නිශ්චය කිරීමේ අරමුණින් හඳුන්වා දෙනු ලැබ ඇති 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත සඳහා අවස්ථා කිහිපයකදී සංශෝධන සිදු කරනු ලැබ ඇති නමුත්, එම පනතින් අපේක්ෂිත අරමුණු ඉටු නොවන බව පෙනී ගොස් තිබේ. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරනු ලැබ ඇති ගෙවල් කුලී නීතිය පිළිබඳ උපදේශක කමිටුව විසින් මේ පිළිබඳව කරුණු අධ්‍යයනය කර ඇති අතර, ඒ අනුව කුලී නිවැසියාගේ සහ ඉඩම් හිමියාගේ අයිතිවාසිකම් සමානව ආරක්ෂා කිරීම අරමුණු කර ගත් නව නීතියක් හඳුන්වා දීම සුදුසු බවට යෝජනා කරනු ලැබ ඇත. එම යෝජනා සැලකිල්ලට ගෙන 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත අවලංගු කිරීම සඳහා සහ පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත නමින් නව පනතක් හඳුන්වා දීම සඳහා පනත් කෙටුම්පත් සකස් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සඳහා සංශෝධන**

වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන අයුරින් 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, එකී පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත**

අන්තර්ජාලය හරහා සිදු කරන අසත්‍ය තොරතුරු ප්‍රචාරය හා ද්වේශ සහගත හැසිරවීම් මගින් සිදු වන හානිවලින් පොදු සමාජය ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාශනය ලැබී තිබේ. එම පනත් කෙටුම්පතේ III කොටසේ දැක්වෙන පරිදි පහත සඳහන් ක්‍රියාවන් මෙම පනතේ විධිවිධාන මගින් වැරදි වශයෙන් අර්ථ නිරූපණය කර ඇත:

* ශ්‍රී ලංකාව තුළ සිද්ධි පිළිබඳ අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම

* අපහාසයට හේතු වන අසත්‍ය ප්‍රකාශ සිදු කිරීම

* අසත්‍ය ප්‍රකාශයක් මගින් කැරලි ගැසීමක් සිදු කිරීම සඳහා නිකරුණේ ප්‍රකෝප කරවීම

* අසත්‍ය ප්‍රකාශයක් මගින් ආගමික රැස්වීමකට බාධා කිරීම

* ආගමික හැඟීම්වලට රිදවීමේ ඒකාන්ත චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම

* ආගමික හැඟීම් නිග්‍රහයට පාත්‍රා කිරීම සඳහා ඒකාන්තයෙන් සහ ද්වේශ සහගත ලෙස අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම

* වංචා කිරීම

* අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම

* සාමය කඩ කිරීමක් සිදු කිරීම සඳහා ප්‍රකෝප කරවීමේ චේතනාවෙන් ම අසත්‍ය ප්‍රකාශයක් මගින් චේතාන්විතව ම නින්දා කිරීම

* කැරැල්ලක් හෝ රජයට විරුද්ධව වරදක් ආදිය සිදු කිරීමට සැලස්වීමේ චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශයක් සංසරණය කිරීම

* හිරිහැර සිදු කිරීම සඳහා සිද්ධි පිළිබඳ ප්‍රකාශ සන්නිවේදනය කිරීම

* ළමා අපයෝජනය

* වරදක් සිදු කිරීම සඳහා බොට් (bot) සෑදීම හෝ වෙනස් කිරීම

ඒ අනුව, එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත් ඉන් අනතුරුව, අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 12. ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරමින් ත්‍රස්ත විරෝධී පනත හඳුන්වා දීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා 2022-09-05 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලද අතර ඒ අනුව, එකී පනත් කෙටුම්පත 2023-03-22 දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ තිබේ. ඉන් අනතුරුව, උනන්දුවක් දක්වන පාර්ශ්වයන් (දේශීය හා අන්තර්ජාතික) ගණනාවක් විසින් එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්ති සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒ අනුව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ඉලෙක්ට්‍රොනික සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් විධිමත් පරිදි අදහස් හා යෝජනා කැඳවා ඇති අතර, ඇතැම් පාර්ශ්වයන් සමඟ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිතුමා විසින් සාකච්ඡා පවත්වනු ලැබ තිබේ. ඒ අනුව, ඉදිරිපත් කරනු ලැබ ඇති සියලු අදහස් හා යෝජනා සැලකිල්ලට ගනිමින් රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ ඇති මුල් පනත් කෙටුම්පත නැවත සංශෝධනය කර නව පනත් කෙටුම්පතක් නීති කෙටුම්පත් සම්පාදක මඟින් පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබ ඇත. එකී නව පනත් කෙටුම්පත සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, එම පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********